චක්‍රලේඛ අංක: 03/2006


මගේ අංකය:- බප/සසේකො/ලේ.නිර්
සමූපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත,
අංක: 50, කිතුල්වත්ත පාර,
කොළඹ 08.

2006.02.13

බස්නාහිර පළාතේ සියලුම සභාපති වරුන් සහ
ග්‍රාමීය බැංකු සංගම් හා ස.ණ.ස. සමිති සභාපතිවරුන් වෙත.

**සමූපකාර සේවක කාර්ය විධිවිධාන සංග්‍රහයට**
**නව විධිවිධාන ඇතුළත් කිරීම 2-10.**

2:10:1 රජයේ වෛද්‍ය නිලධාරියෙකු පහත දැක්වෙන කරුණු සනාථ කරමින් නිකුත්කල වෛද්‍ය සහතිකයක් ඉල්ලුම්පත්‍රය සමඟ ඉදිරිපත් කරන්නේ නම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි සම්පූර්ණ වැටුප් සහිතව මාස 03 ක්ද, ඉන් ඉක්බිතිව අඩ වැටුප් සහිතව තවත් මාස 03 ක්ද, හදිසි අනතුරු නිවාඩු දිය හැකිය.

2:10:1. 1) හදිසි අනතුරේ ප්‍රතිඵලයක් වශයෙන් එහි දැක්වෙන කාලසීමාව තුළ සේවකයා සේවා කටයුතුවල යෙදීම යෝග්‍ය නොවන බව සහ

2:10:1. (2) සේවකයා ලත් තුවාල වල ස්වභාවය සලකා බලා ඔහු නිසි ප්‍රතිකාර ලබන බව

2:10:2 හදිසි අනතුරු නිවාඩු දියයුත්තේ සේවකයා නියම වශයෙන්ම රාජකාරියේ යෙදී සිටියදී ඔහුගේ වරදක් නිසා සිදුවූයේයයි කිව නොහැකි හදිසි අනතුරකින් ඔහුට තුවාල සිදුවී ඇත්නම් පමණි.

2:10:3 මෙසේ ලබාදෙන නිවාඩු ඔහුගේ සාමාන්‍ය නිවාඩු වලින් අඩු නොකල යුතුය.

2:10:4 වෙනත් කිසිම වර්ගයක නිවාඩු හා එකට සම්බන්ධ කොට හදිසි අනතුරු නිවාඩු දිය නොහැකිය.

2:10:5 නියම වශයෙන්ම ස්වකීය රාජකාරී ඉටුකරමින් සිටියදී යම් සේවකයෙකුට රෝගයක් වැලඳුන හොත් ඉහත සඳහන් උප වගන්ති අනුව විශේෂ අසනීප නිවාඩු ලබා දිය හැක. එහෙත් එම නිවාඩු ලබා දියයුත්තේ සේවකයාට එම රෝගය වැළඳුනේ සේවකයා ස්වකීය රාජකාරී ඉටුකරමින් සිටියදී බවටත්, ඔහුගේම ප්‍රමාද දෝෂයක් නොවන නිසා බවටත්, නිශ්චිත වශයෙන්ම ඔහුගේ රාජකාරී වල ස්වභාවය හේතු කොට ගෙන බවටත්, රජයේ වෛද්‍ය නිලධාරියෙකු ඉදිරිපත් කරන සහතිකයක් මගින් අධ්‍යක්ෂ මණ්ඩලයට සෑහීමට පත්විය හැකි නම් පමණි.

ජේ.ජේ. සිරිසේන,
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්: 01 බස්නාහිර පළාතේ සමූපකාර හා පළාත් මාර්ග අමාත්‍යතුමාගේ පෞද්ගලික
පෞද්ගලික ලේකම්, 05. සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ
02. ප්‍රධාන ලේකම් (බ.ප.) 06. සියලුම වෘත්තීය සමිති සංගම් කළුතර, ගම්පහ)
03. ලේකම්, සමූපකාර හා පළාත් මාර්ග අමාත්‍යංශය (බ.ප.)